# අන්තර්පාඨශාලීය භාෂා හා සාහිත්‍ය තරගය
## උපදෙස් පත්‍රිකාව

## 01. කුසලතා තරගය

මෙම තරගය අංශ හතර ම සඳහා පැවැත්වේ. විනිශ්චය මණ්ඩලය ඉදිරියේ තමන් කැමති නිර්මාණ ශිල්පයන්ගෙන් කර දැක්වීමට තරගකරුවන්ට අවස්ථාව ලැබේ.

1. අභිමතාර්ථ
   1. ශිෂ්‍යයින් තුළ සැඟවී ඇති සහජ හැකියා හඳුනාගෙන ඒවා වැඩිදියුණු කරගැනීමට පෙළඹවීම.
   2. නව නිර්මාණ කිරීමට හා විෂය බාහිර ක්‍රියාකාරකම් කෙරෙහි අවධානය යොමු කිරීම
2. තරග කොන්දේසි
   1. තමන් ස්වාධීනව වී පැමිණ කැමති නිර්මාණයක් විනිශ්චය මණ්ඩලය ඉදිරියේ සකසා පෙන්විය යුතු ය.
   2. ස්වකීය නිර්මාණය කිරීම සඳහා පැය 02ක කාලයක් හිමි වේ.
   3. නිර්මාණයට අවශ්‍ය සියලු ම අමුද්‍රව්‍ය හා උපකරණ තරගකරුවන් විසින් රැගෙන ආ යුතු ය.
   4. පහත සඳහන් තේමා යටතේ ස්වකීය නිර්මාණ ඉදිරිපත් කළ හැකි ය.
      - I. මල් හා වෙනත් දෑ නිර්මාණය
      - II. ඉදල්-කොහු බැඳීම
      - III. සිවුරු කැපීම
      - IV. කැටයම් හා මූර්ති නිර්මාණය
      - V. දුවිලි හා පා පිස්නා සැකසීම
      - VI. විදුලි බලයෙන් කෙරෙන නිර්මාණ
      - VII. විද්‍යාත්මක නිර්මාණ
3. ලකුණු ලබාදීමේ ක්‍රමය

| | | |
|---|---|---|
| 1. | නිර්මාණයේ නවතාව | 10 |
| 2. | අමුද්‍රව්‍ය භාවිතය | 05 |
| 3. | නිර්මාණ ශක්තිය | 15 |
| 4. | නිමාව | 10 |
| 5. | සමස්තය | 10 |
| | මුළු ලකුණු | 50 |